පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2017

පාසලේ නම : ........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..................................................
........................................................................................................

කාලය : පැය 03 යි.

## ලංකා ඉතිහාසය II

**සැලකිය යුතුයි :**

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න. ඉන් ඕනෑම ස්ථාන දෙකක ඓතිහාසික වැදගත්කම ගැන කෙටි සටහන් ලියන්න.

(i) දඹකොළ පටුන
(ii) කලාවැව
(iii) මහානාගහුල
(iv) ගම්පොල
(v) වයඹ පළාත
(vi) කප්පකන්දර නදී
(vii) අරිට්ඨපබ්බත
(viii) කෝට්ටේ

(ලකුණු 8 + 5 + 5 = 18)

02. අනුරාධපුරයේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහිලා වංශකතාවලින් ලැබෙන තොරතුරු අභිලේඛන හා අනෙකුත් මූලාශ්‍ර වලින් කොතෙක් දුරට සනාථ වේ දැයි පරීක්ෂා කරන්න.

(ලකුණු 14)

03. දුට්ඨගාමිණී අභය හා වට්ටගාමිණී අභය යන රජවරුන්ගේ දේශපාලන කාර්ය සංසිද්ධීන්හි සමාන අසමනතා පහත දැක්වෙන ශීර්ෂ යටතේ විචාරාත්මක ව විමසන්න.

(i) ඔවුන් මුහුණ දුන් අභියෝග
(ii) දිවයින එක්සේසත් කිරීම

(ලකුණු 14)

Education NCP - www.edncp.lk

04. "ශ්‍රී ලංකාව ජනාවාස වීම එකවර සිදු වූවක් නොවේ"

(i) භද්දකච්චායනා කුමරිය ගොඩබට වරාය නම් කරන්න. (ලකුණු 01)

(ii) විජය කුමරු සමඟ පැමිණි ඇමතිවරු බිහිකළ ගම්මාන දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) මුල් ජනාවාස බිහිවීමේ දී ශ්‍රී ලංකාවේ භෞතික සාධක ඉවහල් කරගත් අයුරු කෙටියෙන් පහදන්න. (ලකුණු 03)

(iv) ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය සිදු වූ අයුරු ඉහත සඳහන් ප්‍රකාශය තුළින් සනාථ කරන්න. (ලකුණු 08)

05. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.

(i) පළමුවන විජයබාහු රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය

(ii) පළමුවන පරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය

(iii) නිශ්ශංකමල්ල රජුට මුහුණ දීමට වූ අභියෝග (ලකුණු 7 + 7 = 14)

06. රජරට ශිෂ්ටාචාරයේ පැවැති වාරි කර්මාන්ත හඳුන්වා වාරි තාක්ෂණය ගැන ප්‍රමාණවත් විමසීමක යෙදෙන්න.

(ලකුණු 14)

07. දඹදෙණි යුගයේ "දේශපාලන හා ආගමික, සාහිත්‍ය" ගැන අවධානය යොමු කරමින් ඇගයීමක යෙදෙන්න. (ලකුණු 14)

08. කෝට්ටේ ශ්‍රේෂ්ඨතම පාලකයා වන හයවන පරාක්‍රමබාහු රජුගේ කාර්ය සාපල්‍යය පහදන්න. (ලකුණු 14)

09. (A) රාජධානි නිරිත දිගට විතැන්වීමත් සමඟ ආර්ථිකයේ හා කලාශිල්පවල ඇති වූ වෙනස්කම් පිළිබඳ ව ඇගයීමක යෙදෙන්න.

(ලකුණු 14)

එක්කෝ

(B) පහත සඳහන් මාතෘකා අතරින් කැමති දෙකක් පිළිබඳ ඓතිහාසික වැදගත්කම විමසන්න.

(i) ප්‍රාග් බෞද්ධ ඇදහිලි හා විශ්වාස

(ii) චෝළ ආක්‍රමණ


(iii) ලංකාවේ පිහිටීම ඉතිහාසය කෙරෙහි බලපෑ අයුරු

(iv) පොළොන්නරුවේ කාන්තා නායකත්වය

(v) අනුරාධපුර යුගයේ වෙළෙඳ සබඳතා (ලකුණු 7 + 7 = 14)

***

Education NCP - www.edncp.lk




Education NCP - www.edncp.lk